## 4 පරිච්ඡේදය:

# දඹදෙණි යුගයේ කතිකාවත් සහ ඒට මුල් වූ දේශපාලන සහ ආර්ථික පසුබිම

මහාපරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලයේ මැද භාගයේ පමණ සිට බුද්ධාගම ලංකාවේ ඉතා උසස් තත්ත්වයකින් බැබළුණේ ය. මේ කාලයේ සිට බුරුමය වැනි රටවල් ලංකාව ථේරවාද බුද්ධාගමේ ආදර්ශ රටක් හැටියට සලකන්නට විය. එහෙත් මෙකල බුදුසසුනේ ඇති වූ දියුණුව වැඩි කල් පැවතුණේ නැත.

මහාපරාක්‍රමබාහු රජුගේ අභාවයෙන් වසර තිස් හයක් ගත වීමේ දී ඉන් පෙර නො වූ විරූ තරමට භික්ෂූන් අතින් මහණ දහම් ගිලිහෙන්නට වූ බව දඹදෙණි කතිකාවතේ සඳහන් වෙයි.[1] දඹදෙණියේ රජ කළ ප්‍රථම රජතුමා වූ III විජයබාහු (ක්‍රි. ව. 1230-1234) රජ බුදුසසුන පිරිහීමෙන් ගොඩගැනීමට කටයුතු අරඹා භික්ෂු ප්‍රතිරූපකයන්ගේ අප්‍රතිපත්ති, දුෂ්ප්‍රතිපත්ති නැති කිරීම සඳහා කතිකාවතක් පිහිටුවී ය.[2] 'ධර්ම විනය සංසන්දනය කොට ඇත්රොල් නොවිහිදූ' (ආචාර්ය සම්ප්‍රදාය නො පිරිහෙළා) කළ ඒ කතිකාවත පිහිටුවීමේ දී ප්‍රමුඛව ක්‍රියා කළෝ ග්‍රාමවාසයට අයත් සංඝරක්ඛිත මහාස්වාමි, මේධංකර මහාස්ථවිර යන දෙනම සහ වනවාසයට අයත් මේධංකර මහාස්ථවිරයන් යන සම්භාවනීය සංඝ පියවරුය.[3] එහෙත් එම කතිකාවත මෙතෙක් සොයාගෙන නැත.

III විජයබාහු විසින් කතිකාවත් දෙකක් පිහිටුවන ලද බව පරණවිතාන මහතා කියයි.[4] ඉන් එකක් යට දැක්වූ කතිකාවත විය යුතුයි. මිහු දක්වන අනික් කතිකාවත ඊට ප්‍රථමයෙන් කරන ලද බවත් එය තාවකාලිකව පිහිටුවන ලද්දක් බවත් කියයි.[5] III විජයබාහු රජතුමා විසින් කතිකාවත් දෙකක් පිහිටුවන ලද හැටියට පරණවිතාන මහතා ඉදිරිපත් කරන කාරණයට පදනම් වන්නට ඇත්තේ දඹදෙණි කතිකාවතේ පූර්විකාවෙහි එම රජතුමාගේ රාජ්‍ය කාලය සම්බන්ධ විස්තරයේ දෙතැනක කතිකාවතක් ගැන සඳහන් වීම විය යුතුයි. ඉන් පළමු සඳහන 'අමුතු කතිකාවකින් සරහා'[6] යනුවෙන් ද, දෙවැන්න 'විජයසුන්දරාරාමයෙහි වැඩ හිඳ ශාස්ත්‍රශාසනානුරූපකාරී

1. කතිකාවත් සඟරා, සංස්. ඩී. බී. ජයතිලක, කැලණිය, 1955, 7 පි. (කස.)
2. එම 8 පි.
3. එම, 8 පි.
4. Ray, H. C. and Paranavitana, S. **University of Ceylon History of Ceylon**, Vol. 1, pt. II, Colombo, 1960, p. 617(**UCHC.**)
5. **UCHC.** p. 617.
6. කස. 7 පි.